වරදක් සම්බන්ධයෙන් චෝදනා ලබන වයස අවුරුදු 16 ට අඩු හා පෙර දඬුවම් නැති කිසිදු බාලවයස්කරුවකුගේ නම හෝ අනන්‍යතාවය හෙළි කරගත හැකි කරුණු මාධ්‍ය මඟින් දැන දැනම අනාවරණය නොකළ යුතු බව මාධ්‍ය ආචාර ධර්ම තුළ දැක්වේ.
විශේෂයෙන්ම පාසල් අධ්‍යාපනය අනවශ්‍ය බාධක වලින් තොරව සම්පූර්ණ කර ගැනීමට බාලයන්ට නිදහස තිබිය යුතු බවද මාධ්‍ය ආචාර ධර්ම මගින් පැවසේ.

මේ අතර, "යතුරුපැදි දෙකක් එකිනෙක ගැටී එක්දරු පියාගේ පාදයක් ඉවතට" යන සිරස්තලයෙන් යුතු පුවත් වාර්තාවක් දිවයින පුවත්පත (12/03) ගෙන එයි. එසේම එම පුවත් වාර්තාවේ දැක්වෙන්නේ "පැදිකරු බාලවයස්කරුවෙක්" බවයි. නමුත්, බාලවයස් සැකකරුගේ නම පුවත් වාර්තාව තුළ සඳහන් වී ඇත.

ඒ අනුව,

1) ඔබ සිතනා ලෙසට, බාලවයස්කාර සැකකරුගේ අනන්‍යතාවය හෙළි කිරීම, කෙතරම් යෝග්‍ය ද?

2) එසේ අනන්‍යතාවය හෙළි කිරීම ඔස්සේ, එම බාලවයස්කාර සැකකරුගේ පාසැල් අධ්‍යාපනය සම්පූර්ණ කරගැනීමට අනවශ්‍ය බාධාවන් එල්ල නොවනු ඇතිද?